# අභිලේඛනවලින් හෙළිවන පුරාණ ශ්‍රී ලාංකේය ශිල්පීය සමාජය

**ආචාර්ය චන්දිම බෝගහවත්ත**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

**Abstract**

According to the chronicles, the Sri Lankan community became civilized From the third century B.C. and further state that Princes Vijaya and his group inhabited this land in six century B.C. Archaeological evidence confirms the existence of a civilized society in Sri Lanka from around the 7th century B.C. Although the cultural transitions and influences of Indian culture on social and cultural reality have continued, there is evidence that a tradition that has been built locally also has functions in a multidimensional and Multilinear aspect. This research paper discusses the observations that the socio-cultural space of this period existed as a professional social organization based on professional and technical experts apart from the rigid cultural beliefs prevailing in India. The social power of social groups such as Kshatriya, Brahmana and Vaishya, which existed in the Indian social and cultural system, fluctuated Ruling on specialization rather than the factor of origin. Individual supremacy in Indian society, such as the claim of the Kshatriyas to the state, the participation of the Brahmins in religious and educational activities, and the trade-in Vaishyas, were also not important factors in Sri Lankan society. The speciality of the Anuradhapura society discussed in this article was that it explained the social dominance based on talent and personal behaviour.

*Key Word*: Anuradhapura Culture, professionals, Artisans, cave inscriptions, Cast.

## ප්‍රවේශය

විජය ඇතුළු පිරිස පැමිණෙන විටත් තම්බපන්ණි ලෙස හැඳින් වූ මෙම දිවයිනෙහි විශාල ජනතාවක් නගර සහ පුර වැනි නාගරික පරිපාලන ක්‍රමවේදයන් මගින් පරිපාලනය වෙමින් පැවැති ආකාරය මහාවංසයෙහි දක්වා තිබේ (පොල්වත්තේ, 1959, පරි, 07). මාළිග ාවන් මෙන් ම කලා සහ සංගීතය වැනි සෞන්දර්යාත්මක භාවිතවන් පැවැති ආකාරයත්,

කුවේණිය විසින් සංක්‍රමණික විජය සමගත් කුවේණිය සිය පරපුර සමගත් සංනිවේදන උපක්‍රම භාවිතා කිරීම දැක්වීම මගින් මහාවංසය මෙම සමාජයෙහි ශිෂ්ටාචාරවත් ස්වභාවය පෙන්වා දී තිබේ (පොල්වත්තේ, 1959,පරි,07,). පණ්ඩුකාභය සමය වන විට කම්කරුවන් සහ පාලකයින් වෙන් ව ජීවත්වන පරිසරයක් සංවර්ධනය වී පැවැති බව මෙන් ම සමාජාර්ථික තත්වයන් සමග ප්‍රභූ සහ නිර්ප්‍රභූ සමාජ මධ්‍යයෙහි සහ ප්‍රත්‍යන්තයෙහි පැවැති ආකාරයත් මනාව මහාවංසයෙහි සංගෘහිතව තිබේ (පොල්වත්තේ, 1959,පරි,07,).

මේ සමාජ සැකැස්ම සංවිධානාත්මක ආගමික බලපෑමක් මගින් එක්වර ම වෙනස් වූ බව වංසකතාව දැක්වුව ද ශිලාලේඛනයන්හි පැනෙන උක්ත සමාජයෙහි තත්‍ය ස්වරූපය හාත්පසින් ම වෙනස් වූවකි. අනුරාධපුර රාජ්‍යයෙහි ආරම්භක සමයෙහි සිට ම සමාජ-සංස්කෘතික සහ භූ දේශපාලනික හැඩගැස්ම වෙත භාරතීය ආභාසය ලැබුන ද මෙරට සංස්කෘතිය ස්වාධීන ලක්‍ෂණයන් ගෙන් ද ආවරණය විය. ආගමික සහ සමාජ සංස්කෘතික සිරිත් විරිත් නිරන්තරයෙන් ම සංකලනය වූ නිර්මාණයක් විය. මේ සංකලනය විජය රජුගේ පරපුරත් ස්වදේශීය පාලකයනුත් අතර පාලන බලය දෝලනය වීමේ දී උච්චාවචනය වූ බව පෙනේ. නමුත් බුදුසමයෙහි බලපෑම හේතුවෙන් මෙම සමාජ-සංස්කෘතික හැඩගැස්ම භික්‍ෂු නායකත්වයෙහි උවමනාවන්ට අනුව සකස්ව තිබුණි. භාරතීය සමාජ ස්ථරායන රීතීන්ගෙන් පරිබාහිරව නව ආකල්ප මත ක්‍රියාත්මක වූ සමාජ පන්තියක ස්වරූපය ශ්‍රී ලාංකේය සමාජයෙන් විද්‍යමාන වීමට එම බලපෑම හේතු වූ බව ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනයන් මගින් තහවුරු වේ. දීපවංසය සහ මහාවංසය ප්‍රමුඛ ඓතිහාසික වෘතාන්ත පෙන්වා දෙන්නේ මෙම සමාජ සංවිධානයයි. සාමාන්‍ය සහ ප්‍රභූ පන්තියෙහි ජනතාව එකිනෙකා කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත පරතරයක් තබා ගත්තේ උපතින් ලද පවුල් පරිසරයෙන් නොව ඔවුනොවුන් සමාජය ඉදිරියෙහි විදහා පෑ සුවිශේෂතා මගිනි.[1] මෙම සුවිශේෂී බව අධ්‍යාපනය, පාරම්පරිකව උරුම කරගත් දැනුම සහ සතතාභ්‍යාසය මත දියුණු කර ගත් හැකියාව ද, පුද්ගලාබද්ධව දියුණු කරගත් හැකියාවන් ද යන අංශවලින් විද්‍යමාන වේ. මේ සමාජය ජීවන ශිල්පීය ඥානය ප්‍රමුඛ කරගත් වෘත්තීන් ප්‍රකාරව වෘත්තීය කණ්ඩායම් ලෙස ගොණු වී සිටියහ. ඔවුහු පොදුවේ හඳුන්වන ලද්දේ ශ්‍රේණි යන පදයෙනි. එවන් සමූහයක එකතුව ගණ හෝ පූග ලෙස සංවිධානාත්මක ලෙස ආයතනගත වීමට තරම් ශක්තිමත් වූහ.

අනුරාධපුර රාජ්‍ය සමයෙහි ශ්‍රී ලාංකේය ආර්ථිකය ශක්තිමත් කිරීමටත් සෞන්දර්යාත්මක පරිසරයක් ගොඩනැංවීමටත් සමත් සමාජ ප්‍රභූත්වයක් හිමිකරගත් ශිල්පී සමාජයක් පැවැති අයුරු මූල බ්‍රාහ්මී අභිලේඛන පරීක්‍ෂා කිරීමේ දී පැහැදිලිව හඳුනාගත හැකිය. උක්ත සමාජය පිළිබඳව අටුවාවන් ප්‍රමුඛ සාහිත්‍ය ග්‍රන්ථයන්හි දැක්වෙන මූලාශ්‍රය සාධක අභිලේඛනයන්හි දැක්වෙන කරුණු තවදුරටත් විස්තීර්ණ කරනු පෙනේ. තත් ශ්‍රී ලාංකේය ශිල්පීන් ( Sri Lankan Artisans) ලෙස අභිලේඛන සහ ප්‍රාථමික සාහිත්‍යයෙහි පෙනෙන සමාජ කණ්ඩායම් පිළිබඳව මෙහිදී කරුණු විමසීමකට ලක් කෙරේ. ඒ අනුව මෙම ලිපියෙහි දී විශේෂයෙන් ම හස්ත කර්මාන්තයන්හි නියැලුණු කර්මාන්තකරුවන් කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරමින් සමකාලීන ශිල්පී ප්‍රජාව පිළිබඳව ශිල්පීය කර්මාන්ත කරුවන් යන අරුතින් සාකච්ඡාවට බඳුන් කෙරේ. ඕනෑ ම ශිල්පීය නිපුණත්වයක් ලබා ඇති පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් මගින් උක්ත සමාජයෙහි ජීවන වෘත්තීන් විෂයෙහි ක්‍රියාත්මක වීමේ ස්වභාවය මෙහි දී හඳුනාගත හැකි වේ. මෙම පන්තියේ ශිල්පීන්ට වඩු කාර්මිකයන් ලෙස උළු, ගඩොල් මෙන් ම දැව නිර්මාණ ශිල්පීහු ද, ලෝහ කම්කරුවන් ලෙස රත්තරන්, යකඩ, තඹ, ටින් මෙන්

ම මැණික් හා ස්වර්ණාභරණ ශිල්පීහු ද, සම්භාණ්ඩ නිපදවන්නෝ, රෙදි වියන්නෝ, සිත්තරුවෝ, කුඹල්කරුවෝ, මූර්ති ශිල්පීහු, ඇත් දත් සහ වෙනත් මූර්ති ශිල්පීන් මෙන් ම දුනු ආදිය නිපදවන්නෝ ද ඇතුළත් වූහ.

ශ්‍රී ලංකාවේ ජනපදකරණය සහ විවිධ ශිල්පීන්ගේ ආගමනයන් පිළිබඳ වංසකතාවන්හි තොරතුරු දැක්වේ. වංසකතාගත මූලාශ්‍රය මත පදනම්ව විමසීමේ දී භාරතීය ජන සංක්‍රමණයන් නිරන්තරව සිදුවූ බව දක්වා තිබේ. පණ්ඩුවාසදේව රාජ්‍ය කාලයේ දී ද ලංකාවට ද'සට ශ්‍රේණින් පැමිණෙන බව සඳහන්ව තිබුණ ද ඒ ද'සට ශ්‍රේණි කවරේ ද යන්න වංසකථාකරුවන් නිශ්චිතව දක්වා නොමැත. අනතුරුව සංඝමිත්තාවන් සමග පැමිණෙන ශිල්ප ශ්‍රේණීන් ලාංකේය සමාජය තුළ ස්ථාවර සමාජ කණ්ඩායම් ස්ථාපනය කරන අයුරුත්, එසේ ම ඔවුන් ලංකාව පුරා ම විසරී ගොස් සමාජ අවශ්‍යතාවන් සහ උවමනාවන් ඉටු කරමින් සමාජ ස්ථරයන් ලෙස ශක්තිමත් වූ ආකාරය බෝධිවංසාදි මූලාශ්‍රයයන්හි පැහැදිලිව දක්වා තිබේ. මෙහි දී ශිලාලේඛනමය සාක්ෂ්‍ය බහුල වශයෙන් ලැබෙන, ශිල්පීන් යැයි හඳුනාගත හැකි ප්‍රධාන සමාජ කණ්ඩායම් පිළිබඳව මෙම පර්යේෂණයෙහි අවධානයට ලක්ව තිබේ. ඒ කණ්ඩායම් ඔවුන්ගේ වෘත්තීය ස්වභාවය මූලික කරගනිමින් වෙළඳ, වෘත්තීය ශිල්පීන් සහ ස්වයං වෘත්තිකයින් යනුවෙන් මූලික වශයෙන් වර්ග කළ හැකි ය. නිපුණ වෘත්තිකයින් අතර පේෂකාරයින්, ලෝහ කාර්මිකයින්, වඩු කාර්මිකයින්, ආයුධ නිෂ්පාදකයින්, ඇත් දත් ශිල්පීන්, මැණික්කරුවන් මෙන් ම සිතුවම් කරන්නන් පිළිබඳව ද මෙහි දී අවධානයට ලක්කෙරේ.

**පෙහෙකර හෙවත් පේෂකාර**

විවිධ අමුද්‍රව්‍ය භාවිත කරමින් පෙහෙකාර වෘත්තියෙහි යෙදුණ ප්‍රජාව පිළිබඳ මූලාශ්‍රය ශ්‍රී ලාංකේය ඉතිහාසයට අහම්බයක් නොවේ. විජය පැමිණෙන විට ද කුවේණි නම් ස්ත්‍රියක කපු කටිමින් සිටි බව වංසකතාව හෙළිකරයි (පොල්වත්තේ, 1959,පරි,07,ගාථාව,11).[2] විවීමේ කර්මාන්තය සහ එහි පැවැති ශ්‍රේණි ස්වරූපය පිළිබඳව සඳහන් වන්නේ ශ්‍රී මහා බෝධි ආගමනයත් සමගිනි. බෝධිය සමග පැමිණි ශ්‍රේණීන් අතර පේෂකාර ශ්‍රේණියක් ද සිටි අතර එහි නායකයාට පේෂකාර නායක තනතුර පිරිනැමිණි. මොහුට අයත් කාර්යය වූයේ තම පිරිවර පේෂකාරයන් සමග මහ බෝධියට වඩනා පැන් පෙරා ගැනීමට පෙරහන්කඩ සහ නූල්, ලණු සැපයීමයි. පාලි බෝධිවංසයේ පෙහෙකාර කුලයේ ජ්‍යෙෂ්ඨයාට එහි නායක කම ලබා දී තිබේ(වැලමිටියාවේ, 1994, පිට,75). සිංහල බෝධිවංසයේ ඒ කටයුතු පැවරුම් පිළිබඳව විස්තරයක් දක්වා තිබේ (සිරිපාල,2018,පිට,250). මහාබෝධි ආගමනය සිදුවන විටත් එනම්, දේවානම්පියතිස්ස රාජ්‍ය සමය වන විටත් පේෂකාර ශිල්පීන් ශ්‍රේණියක් ලෙස ස්ථාපිතව සිටි බවට තොරතුරු වංසකතාවල දැක්වේ. එසේ ම පේෂකාරයින් විසින් ඉටු කරනු ලබන කාර්යය අනුව උපශ්‍රේණි පවත්වා ගෙන ගොස් තිබේ. මහාසීනා තනතුර හිමිව ඇත්තේ එවන් උපකර්මාන්තකරුවන්ගේ නායකයාට බව පෙනේ. මහාබෝධිවංශයේ එන්නේ "සිබ්බක කුල ජෙට්ඨස්ස මහා සිබ්බක නායකට්ඨානං" (පදින්නෝරුවේ,1901,පිට,102) යනුවෙනි. සිංහල බෝධි වංශයේ දැක්වෙන්නේ ගෙත්තම් කුලයක් ලෙසින් වුව ද (සිරිපාල,2018,පිට,214) සෙනරත් පරණවිතාන පෙහෙකර යන්නෙන් වස්ත්‍ර විසිතුරු ලෙස සකසන්නන් ලෙසින් ද දක්වා තිබේ:Paranavitana, 1970,p, xcviii).

නුවරකන්දෙන් ලද පෙහෙකරුවකුගේ මූලිකත්වයෙන් කරන ලද ශිලාලේඛනයක

නාමය ලෙස අශරුය බතික (Paranavitana, 1970,no, 931) ලෙස ද, හිත්තරගමහින්නේන් ලද සෙල්ලිපියක 'හකුලවිය' (Paranavitana, 1970,no, 1160). නම් පේෂකාර ගමක් හඳුනා ගත හැකි වේ. නමක් සඳහන් නොකල පේෂකාරයන් සිටින ගමක් පිළිබඳවත් තොරතුරු ගල්කන්දගම (Paranavitana, 1970,no, 1145). සෙල්ලිපියෙන් ද දැක්වේ. වෙහෙරකෙම සෙල්ලිපියෙහි දැක්වෙන්නේ පේෂකාරයින්ගේ උපකොටසක් වූ නූල් සකසන්නන්ගේ පුගයක් පූගය? පිළිබඳවයි (Paranavitana, 1970,no, 696a).[3] බෝධි වංශයේ එන තොරතුරුවලින්ද, ශිලා ලේඛනවල සඳහන් වන තතවය, තත්තුවාය යන මූලාශ්‍රය මගින් ද මෙම ශිල්පීන් පේෂකාර ගොන්නට වැටෙන බව කිව හැකිය. පේෂකාරයන් සමාජයේ ප්‍රභූත්වයක් සහිතවූ ජන කොටසක් බව ඔවුන් සතුවූ වැව් තිබීමෙන්[4] (Nicholas,1963,p.99) පැහැදිලි වේ.

දුටුගැමුණු රජතුමාට රුවන්වැලි සෑය ආවරණය කර පෙන්වීම සඳහා භාවිත කළ රෙදි ඉතා ඉක්මනින් සපයා දීමෙන් පැහැදිලි වේ. (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912, පරි.32,ගාථා,03-) පේෂකාර ශිල්පීහු අනුරපුර රාජ්‍ය සමයේ දී රටෙහි අවශ්‍යතාව වෙනුවෙන් කටයුතු කල පිරිසක් බැව් මහාවංශයේ දැක්වෙන මෙම වාර්තාව මගින් සනාථ වේ. මෙම කාර්යය සඳහා මැදිහත්ව කටයුතුකළ සද්ධාතිස්ස රජු සන්නාලියන් සමග ප්‍රබල සබඳතාවෙහි ස්වභාවය සිහළවත්ථුවේ එන තිස්ස නම් සන්නාලියාගේ ප්‍රවෘත්තියෙන් පැහැදිලි වේ (බුද්ධදත්ත,1958,පිටු,01.03). මොවුහු කණ්ඩායම් ලෙස කටයුතු කරන ලද පිරිසක් බැව් පේෂකාරයන් වාසය කරන සහ ඔවුන් විසින් තම කර්මාන්ත පවත්වා ගෙන යනු ලබන එක් වීථියක් පිළිබඳව විසුද්ධිමාර්ගයේ සඳහන් ව තිබීම මගින් පැහැදිලි වේ (ධර්මවංස,1959,පිට,251).

භාරතයෙහි ද පේෂකර්මාන්තය ඉතා ම ප්‍රචලිතව ගිය රැකියාවක් වූ අතර මහා පරිමාණයෙන් මෙම රැකියාවෙහි නියුක්තව සිටි බව පෙනෙන නමුත් මෙය සාමාන්‍යයෙන් භාරතීය සමාජය තුළ පහත් රැකියාවක් ලෙස වර්ග කොට තිබුණි. විභංග අටුවාවෙහි දැක්වෙන පේෂකාර තරුණියක සම්බන්ධව කියැවෙන කථාවක දී පේෂකාරයින් පහත් යැයි සම්මත සමාජ කණ්ඩායමක් බැව් ගම්‍ය වේ. "..ඔවුන් පැමිණ නන්වැදෑරුම් ලෙසට ඔවා දුන්න ද ඔහු නොපිළිගන්නා බැවින් මෙසේ කීහ"ඔබ අප කලීනයන් යයි සිතනු ඇති. අප පෙහෙකරුවෝ වන්නෙමු" (බාලසූරිය,2007,පිට,243). මේ ප්‍රකාශයෙන් පෙනෙන්නේ භාරතීය සමාජයෙහි සේ ම ශ්‍රී ලාංකේය සමාජයෙහි ද මෙම වෘත්තිකයින් උසස් යැයි සම්මත සමාජ පන්තිය නියෝජනය නොකළ බවකි.

**කුඹල් කර්මාන්ත ශිල්පීන්**

කුඹල් යන්න වෛදික කුලල් යන්නෙන් බිඳී පැමිණියක් ලෙස පෙනේ. වෛදික යුගයෙහි කුලල් යන්නෙන් හඳුන්වා ඇත්තේ මැටි ආශ්‍රිත කර්මාන්ත කරන ලද ශිල්පී කණ්ඩායමයි (jha,1991,p,24). ශ්‍රී ලංකාවේ ද අඛණ්ඩව පැවතෙන කණ්ඩායමක් ලෙස කඹල්කරුවන් දැක්විය හැකි ය. ඔවුහු භාරතයේ දී පහත් යැයි සම්මත ජීවන වෘත්තීන්ගේ ගණයෙහි ලා සංග්‍රහකොට ඇත. බුදුදහම ශ්‍රී ලංකාවට පැමිණීමට සියවස් කිහිපයකට පෙර දී ලංකාවට පැමිණි ආයර්යයන්හට මෙන් ම ලංකාවේ විසූ දේශීයයන්ට ද තම අවශ්‍යතා සපුරාගැනීම සඳහා මැටි කර්මාන්ත අත්‍යවශ්‍ය අංගයක් විය. ඒ අනුව මිනිස් ජනාවාස සමග අත්‍යයන්තයෙන් බැඳී ඇති කොටසක් ලෙස මෘත්තිකාමය නිර්මාණ පෙන්වා දිය හැකි ය. ලංකාවේ ආර්යාගමණයට පෙර ඉතා දියුණු මැටි බඳුන්

තාක්ෂණයක් තිබූ බවට ඇතුළු නුවර කැණීම්වලින් හෙළිවී තිබේ (Deraniyagala,1992, pp,739-747). කුම්භකාර යන්න ප්‍රථමයෙන් සාහිත්‍යයෙහි භාවිතයට එනු පෙනෙන්නේ සංඝමිත්තාගමණයත් සමගිනි (සිරිපාල,2018,පිට,250). එහෙත් ඊට පෙර දී කුඹල් නමින් නොහැඳින්වුව ද මෘත්තිකාමය නිර්මාණයන් කරන ලද පුද්ගලයින් පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනයේ දී හමු වේ.

මෘත්තිකාමය නිෂ්පාදනයන් විෂයෙහි නියැලීම පිණිස ම පළමුව ලංකාවට පැමිණෙන වෘත්තීය කණ්ඩායම ලෙස හඳුනාගනු ලබන්නේ සංඝමිත්තාවන් සමග පැමිණෙන කුඹල් කුල අටයි. එහි දී ප්‍රභුවරයාට අයත් කාර්යයන් වූයේ තමන්ගේ කුඹල් පිරිවර සමග බෝධිපූජාවේ දී බත් ආදිය පිසීමටත්, පිදීමටත් අවශ්‍ය බඳුන්, කොරොස් ආදිය සැපයීමත් ය. නායකයාට කුඹල්කරු නායක තනතුර පිරිනමා ඇත (සිරිපාල,2018,පිට,250).[5] දේවානම්පියතිස්ස යුගයේ දී 'කුම්භකාර ආවාට' හෙවත් 'කුඹල්වල' නමින් හැඳින්වුණු ප්‍රසිද්ධ ස්ථානයක් විය. මල්වතුඔය අසබඩ ප්‍රදේශයක් මින් කියැවෙන බැවින් කුඹලුන් තමන්ගේ කර්මාන්තයට වුවමනා මැටි ලබාගැනීමට එම ස්ථානය භාවිත කරන්නට ඇත (Rahula,1966,p,24).

කුඹල් කර්මාන්තය (කුම්භකාරකම්ම) කළ පවුල් 'කුම්භකාර කුල' යනුවෙන් හැඳින්විණ. නගරයට ඉතා ආසන්නව මේ ගම් පිහිටා තිබුණි. මේවා 'කුම්භකාරගාම' ලෙස ද හැඳින්විණි. විසුද්ධිමග්ගයේ දැක්වෙන 'තෙරුන්වහන්සේ නුවර දකුණු දොරෙන් නික්ම ථූපාරාමයට යන මග හැර කුඹල්ගම මාර්ගයට පිළිපන් සේක' යන ප්‍රවෘත්තිය එයට මනා නිදසුනකි (ධර්මවංස,1959,පිට,114). එසේ ම දුටුගැමුණු රජ දවස පටන් අනුරපුර නගරයෙන් දකුණු පස වූ කුම්භකාරගම පිළිබඳව බුද්ධඝෝෂ හිමියෝ හෙළි කරති(එම,පිටු, 66.-67).[6] කුඹලුන් සාමාන්‍යයෙන් වෙනසක් නොමැතිව අවශ්‍යතාවන් සැපයූ කණ්ඩායමකි. ඔවුන් අතර බැතිමත් ධනවතුන් වූ බව ශිලා ලේඛන සාක්ෂ්‍ය දරයි. සාහිත්‍යයේ එන කුඹල්ගම් පිළිබඳ තොරතුරු වඩාත් වැදගත් අංගයක් ලෙස පෙන්වා දිය හැකි ය. ඒ අනුව සහස්සවත්ථුවේ එන ආකාරයට ගිරි ජනපදයෙහි සිට අනුරාධපුරයට පැමිණෙන වේළුසුමන කුම්බකාර ගමට ගොස් විශාල කළයක් ගැනීම පිළිබඳව කියැවෙන පුවතින් පෙනී යන්නේ ද කුඹල් ගම් සමාජයෙහි ප්‍රසිද්ධ ව පැවැති බවකි (බුද්ධදත්ත,1959,පිට,85).[7] මේ කුඹල් යන පදය මුල්කරගත් කුම්බසේල විහාරය පමණක් නොව කුඹලතිස්සපබ්බත කුඹ විහාරය මොවුන්ගේ මූලිකත්වයෙන් නිර්මාණවූ විහාරයන් වීමට අවස්ථාවක් නැත්තේ ද නොවේ. පතහමුල්ලේ විහාර සෙල්ලිපිය කර ඇත්තේ කුඹල් කර්මාන්තයෙහි නියුතු චිත්ත නම් තැනැත්තෙකි(Paranavitana, 1970,no, 936).[8] එසේ ම අනුරාධපුරයට දකුණින් පිහිටි කුඹල් ගමක් පිළිබඳව සහ කුඹලෙකු වූ තිශ නැමැත්තෙකු විසින් පූජා කරන ලද ලෙනක් පිළිබඳව ද තොරතුරක් එයි(Nicholas,1963,p,157).

මෙම ශ්‍රේණියේ සාමාජිකයන් අනෙකුත් ශ්‍රේණීන් සමග නිරන්තරයෙන් සහයෝගිව කටයුතු කර ඇති බව වේගිරිදේවාල ලිපියෙන් පැහැදිලි වෙයි(Paranavitana, 1970,no, 807).[9] මේ හේතුන් නිසා කුඹල්කරුවන් සමාජයේ සෑම අංශයක් වෙත ම අත්‍යන්තව බැඳී සිටි බව පැහැදිලි වෙයි. එම නිසා තත්කාලීන සාහිත්‍ය මූලාශ්‍රයන්හි මොවුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අනිකුත් ශ්‍රේණින්ට වඩා තොරතුරු සපයාගත හැකි ය. මොවුන් කණ්ඩායම් ලෙස කර්මාන්ත ගම්වලට ගොනුවීම නිසා රජු ආරාමිකයන් යම් ආරාමවලට පූජාකිරීමේ දී ද නිසැකව ම පූජා වීම නිසා මොවුන්ට ශාසන සංවර්ධනය

විෂයෙහි ක්‍රියාත්මක වීමට ද සිදු වී තිබේ(Wickremasinghe, 1912, pp,.112- 123,206 - 207). අනික් අතට මොවුන් ආරාමයේ සේවය කළ ඉහළ ම නිලයන්ට වඩා වැඩි වැටුපකට හිමිකම් ලැබූහ. වෙස්සගිරි විහාරයේ වැඩ කළ කුඹල් ශ්‍රේණියට දෙවන ශ්‍රේණියේ ඉහළ වැටුපක් ලැබුණි. එයින් ද වඩාත් විශේෂයක් ලෙස සැලකිය හැකි වන්නේ මිහින්තලයේ දී ඉහළ නිලධාරීන්ටත් වඩා වැඩි වැටුපක් මොවුන්ට හිමි වීමයි(ගුණවර්ධන,1993,පිට,126). මොවුන්ගේ රෙදි සේදීමට වැටුප් ගෙවන ලද සේවකයන් පත් කර තිබීමෙන් ඒ බැව් පැහැදිලි වේ. (Wickremasinghe,1912,p,.97). පොලොන්නරු යුගය අවසානය දක්වා ම මොවුන් කුලයක් ලෙස බෙදී නොගිය අතර කුඹල් ශ්‍රේණියක් ලෙසට ම පැමිණි බවට මහා වංශය සාක්ෂි දරයි(හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ළ පරි.86,ගාථා,105-).

භාරතීය සමාජයෙහි ඉතා උසස් සමාජතත්වයක් මේ කුඹල් කර්මාන්ත කරුවන්ට තිබුණි. එසේ ම ශ්‍රී ලංකාවේ ද ඔවුහු උසස් සමාජපන්තියක් ලෙස ම ජීවත් වී තිබූ බැව් ඉහත දක්වන ලද තොරතුරුවලින් පැහැදිලි වේ. මේ තොරතුරු පරීක්ෂා කර බැලීමේදී පෙනී යන කරුණ වන්නේ ඔවුන් සමාජයේ ශිල්පීය පිරිසක් ලෙස ජීවත් වූ ධනවත් සමාජ කණ්ඩායමක් බවත් ය.

**ලෝහකාර ශිල්පීන්**

ලෝහ වර්ගවලින් විවිධ නිර්මාණ කරනු ලබන ශිල්පීහු සමස්තයක් වශයෙන් මෙම කොටසට ඇතුළත් කළ හැකි ය. වංසකතාවන්ට අනුව ශ්‍රී මහා බෝධියත් සමග මෙම ශිල්පය ප්‍රගුණ කරන ලද කණ්ඩායම් තුනක් පැමිණ තිබේ. එසේ පැමිණි අය අතුරින් රන් රිදී වැඩ කරන ලද අය රන්කරුවන් ලෙස ද යකඩ වැඩ කරන අය කබර හෙවත් කඹුරන් ලෙස ද බෙදී ඇති නමුත් ශිලාලේඛනවල තඹ වැඩ, ටින්වැඩ කරන ලද අය පිළිබඳව සඳහන් වෙතත් මොවුන් පෙර කියන ලද ශ්‍රේණීන්වල උපශාඛාවන් ලෙස සැකසුණු කොටස් ලෙස ගැනිය හැක (Paranavitana, 1970,pp,xcvii-iii). . ලෝහාකාරක ශ්‍රේණි ලෙස මහාබෝධි වංශය දක්වන්නේ කඹුරු, ලෝහකුරු, අටතෙලි යන කොටස් තුනයි (සිරිපාල,2018,පිට,250). මේ තුන් කොටස පිළිබඳව තොරතුරු සෙවීමේදී මොවුන් තම රැකියාවන් ස්වාධීනව පවත්වාගෙන යන ලද ස්වාධීන ශ්‍රේණීන් ලෙසින් ක්‍රියාත්මක වූ බව පෙනේ. ක්‍රි. පූ. හයවන සියවසේ සිට ම සමාන වෘත්තීන්හි නියැළුණ ශිල්පීන් කණ්ඩායම් ලෙස එක්ව ශිල්පීන්ගේ ශ්‍රේණි පවත්වා ගත් බව ජාතක කථා සහ වෙනත් මූලාශ්‍රයන් රැසක දැක්වේ. භාරතීය සමාජයෙහි කම්මල්කරුවන්, රන්කරුවන්, ලෝහ කම්කරුවන් සහ තවත් බොහෝ වෘත්තීන්හි නියැළුණු ශිල්පීන්ගෙන් සැදුම් ලත් ශ්‍රේණීන් සිටි බව භාරතීය සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන්හි දැක්වේ (Thaplyal,1996,p,995)

පාලි සාහිත්‍යයේ එන ආකාරයට ලෝකුරුවෝ (ලෝහකාර) කෘෂිකර්මයට, දඩයමට, ගෙදර දොර කටයුතුවලට හා යුද්ධයට අවශ්‍ය උපකරණ සෑදූහ. මානව අවශ්‍යතා සඳහා අවි ආයුධ විශාල වශයෙන් නිපදවීමට ඔවුන්ට සිදුවිය. ඒ අතර උදළු (කද්දාල ) දැකැති (දාත්ත) පොරෝ (ඵරසු), කුඩා පිහියා, (වාසි) කෙටේරි (කට්ඨාරි) භාරන ආයුධ (සත්ත) තෝමර (තෝමර) ද හෙල්ල වැනි අනිත ආයුධ විශේෂයන් වූ කුත්ත ද උණපදුරු කැපීමට ගන්නා ආයුධ (වෙළු ගුම්බජේදක සත්ති) හා තණකැපීමට ගන්නා උපකරණ (තිණලායන) ආදි දෑ මොවුන් නිර්මාණය වූ බව පාලි සාහිත්‍යය විමර්ශනය කිරීමේ දී හමුවන අවි ආයුධ අතළොස්සකි.

ලෝකුරුවන් සතු කාර්ය ලෙස හඳුනාගෙන ඇත්තේ තඹ හා යකඩ වැනි බරපතල කර්මාන්ත කිරීමයි (Nandadeva Wijesekara,1960,ms,159). ප්‍රාග් මහින්ද අවධියෙහි ශ්‍රී ලංකාවේ විසූ දක්ෂ ලෝහ කර්මාන්තකරුවන් පිළිබඳව පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය මෙන් ම වංසකතාගත තොරතුරුද රැසෙකි. දීඝගාමිණී කුමාරයා ලෝහමය කර්කටක යන්ත්‍රයක් භාවිත කිරීම පිළිබඳව මහාවංසය දක්වන මූලාශ්‍රය ඒ සඳහා මනා නිදසුනකි (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.09,ගාථා,17-). සංඝමිත්තාවන් සමග පැමිණි පිරිස පිළිබඳව සඳහන් කිරීමේ දී බෝධිවංශය "කුඹුරු කුලෙහි ප්‍රධානයනට තම පිරිවර කුඹුරන් ගෙන මහබොය පිලිල් බෙදුරු ආදිය හරනා කර කතුරු කියත්පත් කරවා දෙනු කොට කුඹුරුනා තනතුරු දුන්නේය'' (සිරිපාල,2018,පිට,250) යනුවෙන් සඳහන් කර තිබේ. පාලි බෝධිවංශයේ ද මේ තොරතුරු පැහැදිලිව දක්වා ඇත (පදින්නොරුවේ,1890,පිට,102). පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන අතර මොවුන් හඳුන්වා ඇත්තේ කබර යන පදයෙනි (Paranavitana, 1970,p,xcvii). බ්‍රාහ්මණයාගම සෙල් ලිපියක, කබර පුශ(Paranavitana, 1970,no, 161) හමුවන අතර මඩුගස්මුල්ල සෙල්ලිපියක ද කිසිදු උපාධි නාමයක් රහිත කබර තිශ තැනැත්තා දායකයාව සිටි පූජාවක තොරතුරු හමුවේ(Paranavitana, 1970,no, 720). එසේ ම කබර දින්න අපට දැකගත හැකිවන්නේ ගල්වැට විහාර සෙල් ලිපියකිනි(Paranavitana, 1970,no, 1049a). මේ අතර 'ගපති' යන උපාධි නාමය සහිතව අපට කාර්මිකයෙකු දැකගත හැකිය. එය මුතුගලින් ලද්දකි(Paranavitana, 1970,no, 301). විශේෂයෙන් ම දැක්විය හැකි තොරතුරක් වන්නේ මොවුන්ගේ ශ්‍රේණියක් පිළිබඳව සඳහන් වීමයි. මෙහි දී එහි නායකයා හා උපනායකයා පිළිබඳව සටහන් වී තිබේ. නායකයා ජෙට චරතිශ වූ අතර උපනායකයා අනුජෙට නාග ලෙස දක්වා තිබේ (Paranavitana, 1970,no, 1198).

යකඩ වැඩවලට අමතරව මේ ශ්‍රේණියේ ජනතාව තඹ නිපැයුම් කර්මාන්තයන්හි ද නියැලී තිබේ. ශ්‍රී ලංකාවේ තඹ නිධි පැවැති බව මහාවංශය ද කරයි (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.27,ගාථා,42-). එසේ ම පැරණි ලංකාවේ තඹ කර්මාන්තය ඉතා දියුණු තත්ත්වයක පැවති බව දුටුගැමුණු රජු ලෝවාමහාපාය තඹ උළුවලින් හෙවිලි කිරීමෙන් පැහැදිලි වේ (Paranavitana, 1970,p,xcvii). තඹකරුවන් පිළිබඳ එන සෙල්ලිපි අතර පෙරිය පුලියංකුලමෙන් ලද සෙල්ලිපි දෙක ප්‍රධාන ස්ථානයක් ගනී. එහි දී තඹකර තිශ (Paranavitana, 1970,no, 350) හා පුශ (Paranavitana, 1970,no, 351) යන දෙදෙනෙකු පිළිබඳව සඳහන් වෙයි. කුරුනෑකල්ලු ප්‍රදේශයෙන් ලද ලිපියක පරුමක තත්වයෙහි සිටි දායකයා තම නමට විශේෂණයක් ලෙස තබර යන්න යොදාගෙන තිබේ (Paranavitana, 1970,no, 319). මොවුන්ගේ ශ්‍රේණි ක්‍රමය පිළිබඳව සෘජුව ම තොරතුරු නො එතත් කබරවරුන් හා සම තත්ත්වය සිටි නිසා මොවුන් ද කබරුන්ගේ උපශ්‍රේණියක් ලෙස ව්‍යාප්තව සිටි බව පෙන්වා දීමට පරුමක නාමය භාවිත කර තිබීම ම උදාහරණ ලෙස ගත හැකි ය. ලෝහ කර්මාන්තයෙහි නියුතු ශ්‍රේණියෙහි තවත් පුද්ගලයකු 'තොපස සුමන' විය (Paranavitana, 1970,no, 370). මොහු ගපති වරයෙකු ලෙස දක්වා ඇති හෙයින් සමාජයෙහි ගෞරවාන්විත තත්වයක සිටියෙකු බැව් පෙනේ. පරණවිතාන මහතා 'තොපස' යන්න පරිවර්තනය කර ඇත්තේ බෙලෙක් වැඩකරු (Tin Smith) යනුවෙනි (Paranavitana, 1970,no,xcviii). මෙම පර්යේෂණයට භාජනය වන සමයෙහි ටින් අමුද්‍රව්‍යය වර්තමාන චීනයෙන් ආනයනය කරන ලද ඒවා ලෙස පිළිග ැනීමට පර්යේෂකයින් උනන්දු වී තිබේ (Chakrabarti, D.K.; Lahiri, N. 1996,pp,01-30).

වෘත්තියට අදාළව ආගමික සංස්කෘතියක් ගොඩනගා ගත් මොවුන්ගේ ගන දේවතාව ලෙස කම්මාර දේව සැලකේ. දෙවනපෑතිස් රාජ්‍ය සමයේ "කම්මාර දේවතා'' නමින් දක්වා ඇති දෙවියන් ලෝකුරුවන්ගේ දේවතාව ලෙස පිළිගැනීමට ලක්ව තිබේ(Paranavitana,1929, pp.302-327). මෙම ශිල්පීන්ගේ වෘත්තීය පැවැත්ම අනුරපුරයෙන් පසුව බිහිවන රාජධානි වන පොලොන්නරුවට ද ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වූ අතර පොලොන්නරු රාජ්‍ය සමයෙන් අනතුරුව දඹදෙණිය රාජ්‍ය පාලන සමය පැමිණිය ද මේ ශිල්පීය ශ්‍රේණිය සක්‍රීයව පැවැති බව අපට මහාවංශයෙන් හඳුනාගත හැකි ය (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.86,ගාථා,105). එහෙත් අනුරාධපුරයෙහි තරම් සාධක අනෙක් රාජධානි තුළින් හමුනොවීම මෙම ශිල්පීන් පිළිබඳ විමර්ශනය කිරීමේ දී ඇති ප්‍රධාන ගැටලුවක් ලෙස පෙනේ.

**රන්කරුවන්**

රන්රිදී වැඩකරුවෝ සුවණ්ණකාර, තුළාරකම්ම, කම්මාර යන වචනවලින් ද සාහිත්‍යය සිංහලයේ තුරාල් ස්වර්ණකාර, බඩාල් යන නම්වලින් හඳුන්වා ඇති අතර මොවුහු ඉතා ම ධනවත් පිරිසක් වූහ. රන්රිදී කාර්මිකයන්ගේ ශිල්පීය කණ්ඩායමේ ප්‍රධානියා ''කම්මාරජෙට්ඨක'' යනුවෙන් හැඳින්විණි. ශ්‍රී මහා බෝධියත් සමග ලංකාවට පැමිණි අය ''අටතෙලිනා'' ලෙස දක්වා ඇති අතර මේ පිරිසේ නායකයාට ''අටඨකුල'' හෙවත් 'අත්තුලෙනා' නම් තනතුර පිරිනමන ලදී. තම තරහළු පිරිවර සමග මහබෝධියට රන්වැට රිදිවැට මෙන් ම රන් හා රිදි වළං ආදිය සැපයිමද ඔවුන් සතු කාර්යභාරය විය (සිරිපාල,2018,පිට,250).

ක්‍රි. පූ. තෙවන සියවසෙහි සිට මොවුන් විසින් කරන ලද පූජාවන් පිළිබඳව දැක්වෙන ශිලාලේඛනයන්හි ''තලදර'' යන වචනය මොවුන්ගේ ශිල්පීය ක්ෂේත්‍රය දැක්වීමේ දී භාවිත කර ඇත. මෙහි තලදර නාග නම් තැනැත්තෙකුගේ පුත්‍රයෙකු වූ ''දේව'' නැමැත්තෙකු විසින් කරන ලද පූජාවක් පිළිබඳව සඳහන් වෙයි (Paranavitana, 1970,no, 80).[10] මෙම කාලයට ම අයත් මණ්ඩගලින් ලැබෙන සෙල්ලිපිය හවුල් පූජාවකි. මෙහි දැක්වෙන අනුරුද්ධ හිමියන් ගිහි කල 'තලදර සුමන' සමග සහයෝගීව කටයුතු කරන්නට ඇත (Paranavitana, 1970,no, 593).[11]

මෙම ශිල්පීන් රජු සමග ඍජු සබඳතා පවත්වා ගන්නට ඇති බව සීහළවත්ථුවෙහි දැක්වෙන ලෝකුරු කුන්ත පිළිබඳව කියැවෙන කතා පුවතකින් පැහැදිලි වේ(පොල්වත්තේ,1958,පිට,96). මොවුහු රන් ආභරණ සැකසීමේ කටයුතු පමණක් නොව අනෙකුත් ලෝහ කර්මාන්තයන්හි ද විශේෂඥයින් වූ බව තමනට අවශ්‍ය කෘෂි උපකරණ කිහිපයක් සකස් කරවා ගැනීම සඳහා අනුරාධපුරයේ වාසය කරන එක්තරා ප්‍රසිද්ධ තරහලුවකු වෙතට ගිය ගොවියකු පිළිබඳ සීහලවත්‍ථුවෙහි සාලිරාජ කුමාරයාගේ කතා පුවතෙහි දැක්වෙන කරුණු මගින් පැහැදිලි වේ (පොල්වත්තේ,1958,පිට,23).

**වඩ්ඩක හෙවත් වඩුවන්**

සංඝමිත්තා තෙරණිය සමග පැමිණි වඩු ශිල්පීන්ගේ ප්‍රධානයාහට මහ ඇදුරුනා තනතුර හිමි විය. තම පිරිවරත් සමග මහ බෝ මගුලෙහි දී මහ වියන් මඩු හා රුවන් මඩු කරවා දීම ඔවුන්ට භාර තේවාව වූ අතර සිංහල බෝධි වංශයෙහි එය දක්වා ඇත්තේ 'වඩුකුලෙහි ප්‍රධානයාහට තමා පිරිවර වඩුවන් ගෙන මහබො මගුලෙහි මහා වියන් මඩු

හා බෝධි පූජාවෙහි රුවන් මඬු කරවා දෙනු කොට ලක් දිව් මහ ඇඳුරුනා තනතුරු... දී ලෙසිනි (සිරිපාල,2018,පිට,250). පාලි බෝධිවංශයේ දී දක්වා ඇත්තේ ලංකා ' ලංකා මහා ආචරියට්ඨානං' යනුවෙනි (පදින්නෝරුවේ, 1901,පිට,102). 'ආචාරි' යන්න සඳහා කෝෂ ග්‍රන්ථයන්හි ගුරුවරයා යන අර්ථය ලබා දේ. ප්‍රායෝගික ජීවිතයේ දී ද එය භාවිත කරනු ලබන්නේ ගුරුවරයා යන්න දැක්වීමේ අර්ථයෙන් බව පැහැදිලිය(වැලිවිටියේ, 1952,පි,117). එසේම ආචාර්ය යන්නට පර්යාය පදයක් ලෙස 'ඇදුරා' ලෙස සාමාන්‍ය භාවිතයේ දී යෙදෙන බව ද පෙනේ. හමුවන ශිලා ලිපි රැසක''ඇදුර්'' යන වචනය වඩුවන් සහ වාස්තුවිද්‍යාඥයන් හැඳින්වීම උදෙසා භාවිත කර තිබේ. ක්‍රි. පූ. තෙවන සියවසෙහි ශිලාලේඛනන්හි ''වඩක'' යන පදය මගින් වඩුවන් හඳුන්වා දී ඇත (Paranavitana, 1970,no, 634,657). එසේ ම කොටකන්ද ඇත්කඳ විහාරයෙහි කහවණු සියයක් තැන්පත් කරන ලද මාරවිල වීස ද වඩුවෙකි. ඔහු හැඳින්වීම සඳහා භාවිත කර ඇති වඩුක යන පදයෙන් අදහස් වන්නේ ලී වඩුවා යන්න ය (Jayanta Uduwara,1991, no26). විශේෂයෙන් ම සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා ලිපියෙහි කර්මාන්තකරුවන් ශිල්පීය ශ්‍රේණියක් ලෙසින් දක්වා ඇත. එහි දී වඩු යන පදය භාවිත කර ඇත්තේ සියලු ම කර්මාන්තකරුවන් හැඳින්වීම සඳහා බව ඒ යටතේ සඳහන් කර ඇති කාර්යයභාරයන් පිළිබඳව විමසීමේ දී පැහැදිලි වේ (Wickremasinghe, 1912, 75- 113). එහි දී වඩු මහඇදුර්, ඇදුර්වඩු, සිරිවඩු, (පින්තාරු) උළුවඩු, (උළු, ගඩොල්) කටුවඩු, (ලී) ආදීන් පමණක් නොව මේ අය සඳහා වෙන්කර තිබූ වඩුදෙවැගම නම් ගමක් පිළිබඳවත් සඳහන් කර තිබේ (Ibid).

සාමාන්‍යයෙන් වඩුවන් ලෙස සෑම ඉදිකිරීම් කටයුත්තක ම නියැලෙන්නන් සඳහා භාවිත කළ වචනය විය. මෙහි දී ගඩොල් නිෂ්පාදනය කරන්නන්, උළු නිෂ්පාදනය කරන්නන්, ගෙවල්වැඩ, ගල්වැඩ, ලී වැඩ, රථවාහන වැඩ ආදි සෑම කර්මාන්තයක් ම කරන්නා එකල වඩුවා යන පොදු නාමයක් යටතේ ව්‍යවහාර කර තිබෙන අතර වාස්තුවිද්‍යාඥයා යන්නට ද වඩක යන පදය භාවිත කර තිබේ. පරණවිතාන මහතා වාස්තුවිද්‍යාඥයා යන අරුතින් සිතුල්පව්වේ ශිලා ලිපියක ශෝණ නම් වඩුවා මෙන් ම දෙකුන්දර වැව ලිපියක දැක්වෙන වඩක සුවතිය හඳුන්වා දී තිබේ (Paranavitana, 1970,no, 634,657). එහෙත් ක්‍රි. පූ. පස්වන සියවසේ සිට ශ්‍රී ලාංකේය සමාජය පිළිබඳ තොරතුරු දක්වන මහා වංශකරු වඩ්ඩකී (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912, පරි.86,ගාථා, 105) යන්න භාවිත කරනු ලබන්නේ ගෘහනිර්මාණ ක්ෂේත්‍රයෙහි සියලු නිෂ්පාදන සිදු කළ පුද්ගලයින් හැඳින්වීම සඳහා බව පෙනේ. මෙය ක්‍රිස්තුවර්ෂාරම්භයෙන් පසුව ලියැවී ඇති ශිලාලේඛනවලදී ද වඩුවන් පිළිබඳව සඳහන් මූලික අවස්ථාවේ ලෙස ම භාවිත වනු දැකගත හැකි ය. පොලොන්නරු යුගයේ දී ද මෙම කොටස් පිළිබඳව එසේ ම සඳහන් වේ (බුද්ධදත්ත,1959, පරි.86,ගාථා,105.107).[12]

උළු වඩුවන් පිළිබඳව සෙල්ලිපිවල දැක්වෙන අතර මෙහි දී උළු යන්නෙන් අදහස් කර ඇත්තේ මැටි භාවිත කරන ලද විශාල මැටි නිෂ්පාදන බව පෙනේ. මෙම මහා පරිමාණ නිෂ්පාදන අතර ගඩොල් ප්‍රධාන වූ අතර වහල සෙවිලි කරන උළු ද එසේ ම නිෂ්පාදනය විණි. පැරණි ස්තූප හා විහාර ගොඩනැගීමේ දී බොහෝ සෙයින් ගඩොල් භාවිත කොට ඇති බැවින් ගඩොල් තැනීම ඉතා වැදගත් කර්මාන්තයක් ලෙස පැවති බව පැහැදිලි ය. මහාථූපය නිර්මාණය කිරීමේ දී උළුවඩුවන් 500 දෙනෙකුගේ අදහස් විමසූ බව වංශකථාව දක්වන්නේ එහෙයිනි. (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.30,ගාථා,05). උළුවඩුවන් පිළිබඳව ධාතුවංසයෙහි දැක්වෙන පුවතක් මගින්

මහාවංසයෙහි දැක්වෙන කරුණ සනාථ කළ හැකියාවක් පවතී. "ඉක්බිති රජ්ජුරුවෝ සියලු උළු වඩුවන් රැස් කරවා ඒ උළු වඩුවන් අතුරින් ජයසේන නම් උළු වඩුවකු පරීක්ෂා කොට ගත්තෝය, ඕහට වනාහි පළමු කොට ලක්ෂයක් අගනා පිළි දෙකක් ද කහවණු දහසක් ද ස්වර්ණකුණ්ඩලාභරණා දී වූ ආභරණ ද දුන්නෝය, ඔහු පිරිවර වඩුවන්ටද පිළි ආදි වූ උපකරණ දී..." ( විජේරත්න ,2019,පිට,546). තමා ම සේවයේ නොයෙදී තම සේවක වඩුවන් ලවා කර්මාන්ත කරවු වසභ නම් ප්‍රධාන වඩුවකු පිළිබඳ පුවතක් අටුවාවන් උපුටා දක්වමින් නිකලස් මහතා පෙන්වා දී ඇත (Nicholas,1957,pp.68-80). මෙසේ ම ප්‍රධාන වූ වඩුවකු පිළිබඳ පුවතක් වංසත්ථප්පකාසිනියෙහි එන අතර ඔවුගේ නමට පරව වඩ්ඪකී යන්න යොදා තිබීමෙන් පුද්ගල තනතුර පැහැදිලිව හඳුනා ගත හැකිව තිබේ.(අකුරටියේ සහ දිසානායක,2001,පි.426). මෙම කර්මාන්ත ශිල්ප කණ්ඩායමේ මූලිකයා වූයේ ප්‍රධාන ශිල්පාචාරි තැන ය. 'වඩුමහ ඇදුර් මට දෙටු ශිල්පීහු (ඇදුරු වඩු) දෙනෙක් වූහ'. මොවුන් සමග සිර් වඩු නමින් යුත් කණ්ඩායමක් වැඩ කරන ලදී. මෙම ශිල්පීය කණ්ඩායම් තමන් වෙත පවරන ලද රාජකාරීන් ඉටුකළ යුතු ආකාරය අභයගිරි සංස්කෘත ලිපියේ ද පැහැදිලිව දක්වා තිබේ (Wickremasinghe,1912,pp,.5-7). එපමණක් ද නොව මොවුන් සමාජයෙහි අයත් කරගෙන සිටි තත්වය හතර වන මිහිඳුගේ මිහින්තලා සෙල් ලිපියෙහි දක්වා ඇති කරුණු මගින් තවදුරටත් පැහැදිලි වේ(Wickre masinghe,1912,pp,.75-115).[13]

වඩුවන්ගේ ගම් වඩුගම් ලෙස දැක්වෙන අතර පාලියේ දී වඩ්ඪකි ගාම ලෙස නම් කර ඇත. ඔවුහු රජදරුවන් සමග සබඳතා පවත්වා ගත්හ. මේ බව සනාථ වන්නේ වසභගෙන් එල්ල වූ තර්ජනයන්ට බිය වූ සුභ රජු තම දියණියන් හා රාජකීය කකුධ භාණ්ඩ ආරක්ෂාව පිණිස තම මිත්‍ර වූ වඩුවකුට භාරදුන් බව මහාවංසයෙහි දක්වා තිබීම මගිනි (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912. පරි.36,ගාථා,101.103). සද්ධර්මරත්නාවලියේ ඇති කාෂ්ටවාහන කථාවස්තුවේ රාජ්‍යත්වය සඳහා ලී වඩුවෙකු ඉදිරිපත් වන ආකාරය දක්වා තිබේ. (සරත්චන්ද්‍ර,2014,පිටු,570.580). මේ අයුරින් භාරතීය සංදර්භයෙහි ද සමාජයෙහි සෑම ස්ථරයක් ම නියෝජනය කිරීමට තරම් ශක්තිමත් පිරිසක් ලෙස වඩ්ඪකී ශිල්පීන් හඳුනාගෙන සිටි බව පෙන්වා දිය හැකි ය.

**මැණික්කාර ශිල්පීන්**

ඈත අතීතයේ සිට ම ලංකාව මැණික්වලට ප්‍රසිද්ධ තිබූ බව ඓතිහාසික වාර්තාවන්හි දැක්වේ. එසේ ම බොහෝ රජවරුන් මාණික්‍ය භාවිත කරමින් ආභරණ මෙන් ම ආගමික පිළිම උදෙසා නේත්‍රාවන් ද සකස් කරවා ගත් බව වංශකතාවන්හි දැක්වේ. දුටුගැමුණු රජු රුවන්මුවා බෝධියක් සකස් කිරීම ද (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.30,ගාථා,63) විවිධ රජවරුන් ආගමික සංස්ථාව විෂයෙහි මාණික්‍යමය වස්තූන් පූජා කිරීම ද දැකගත හැකි ය (එම, පරි,36,66, පරි,38,62). ධාතුවංසයෙහි මැණික්වලින් කරන ලද නිර්මාණ පිළිබඳව දීර්ඝ විස්තරයක් දක්වා තිබේ (විජේරත්න,2019, පිටු , 553.569). ක්‍රි. පූ. තෙවන සියවසෙහි පටන් ම මෙම ශිල්පීන් විසින් කරවා පූජා කරන ලද ලෙන් ආරාමයන්හි සටහන් කරන ලද ශිලා ලේඛන මෙම ශිල්පීන්ගේ සමාජ තත්වය පරීක්ෂා කිරීම සඳහා බෙහෙවින් උපකාරී වේ.

මැණික් ආභරණ ශිල්පීන් ප්‍රාමාණිකව සමාජයෙහි ධනවතුන් වූ බව මාම්පිටිය විහාර ලිපියෙන් හඳුනාගත හැකි ය. එහි දී මැණික් වැඩ කරන ශිල්පියෙකු තමා

සතු කහවණු විහාරයට පූජා කොට ඒ බව ශිලා ලිපියකින් තහවුරු කර තිබේ (Paranavitana, 1970,no,791). මණිකර යන්නට අමතරව මණල යනුවෙන් පූර්ව බ්‍රාහ්මී ලේඛනයන්හි මෙම මැණික්කාර ශිල්පීන් දක්වා ඇති බව කල්ලංචිය ලිපියකින් හෙළි වේ (Paranavitana,1970,no,185b)[14] මීට අමතරව පණික්කුලම (Paranavitana, 1970,no,209)[15] හා ආනයික්කුට්ටිකන්ද (Paranavitana,1970,no,74)[16] ද ගල්ගමුව[17] ලිපිය(Paranavitana, 1970,no,1033) ද මැණික් වැඩ කල ශිල්පීන් පිළිබඳව තොරතුරු හමුවන අනෙකුත් ශිලා ලේඛනයන් ලෙස පෙන්වා දිය හැකි ය. කෙසේ වෙතත් මේ ශිල්පීන් අනෙත් වෘත්තිකයින් සමග සහයෝගයෙන් කටයුතු කර ඇත. ගල්ගේ ලිපිය නීතිඥ වරයෙකු සමග ද (Paranavitana, 1970,no,1122) වේගිරි දේවාල ලිපිය මැටිභාණ්ඩ නිපදවන්නෙකු හා ඇත් දත් කාර්මික ශිල්පියෙකු හා සම්බන්ධ වීමෙන් ද පූජා කර ඇත (Paranavitana, 1970,no,807). සමාජ ප්‍රභූත්වය පෙන්නුම් කරන අභිධානයක් ලෙස සැලකෙන ගපති යන අභිධානය සමග තමාව හඳුන්වාගත් ශිල්පියෙකු පිළිබඳව කෝන්වැව ලිපියකින් පැහැදිලි වේ (Paranavitana, 1970,no,546)[18] මොවුන් විසූ ගම් හඳුන්වා ඇත්තේ මැණිකාර ගාම යනුවෙනි. මහල්ලකනාග රජු විසින් කරන ලද පූජාවක් දැක්වීමේ දී ඔහු මැණික්කරුවන්ගේ ගමෙහි වූ වැවක් පිළිබඳව කිය ඇත (Paranavitana, 1983,no,73). වෙස්සගිරියෙහි සිරිනාග රජු විසින් කරවන ලද ලිපියක සඳහන් වන්නේ මණිකාර ගමකවූ වැවක බදු විහාරයට පූජා කළ බවකි(Paranavitana, 2001,no,105) චන්දමුඛශිව රජු ද මණිකාරගමක වැවක් තනවා ඉසුරුමුණි විහාරයට (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912, පරි.35,ගාථා,47) පූජා කළ බවක් දක්වා තිබේ. මැණික්කරුවන්ට අයත් වැව් ශිලා ලේඛනයන්හි මණිකරවවි ලෙසත් වංසකතාවන්හි මණිකාර වාපි ලෙසත් දැක්වේ(Paranavitana, 1983,no,80).

මැණික්කරුවෝ තමන් ස්වයංව නිර්මාණ කරණයෙහි යෙදුණ අතර ඇතැම්විට ස්වාමියෙකු යටතේ ද සේවය කළහ. දමෙඩ ඔයෙන් ලද මහාචූලික මහානාග රජුට අයත් මැණික් කර්මාන්ත ශාලාවක් පිළිබඳව කියැවෙන සෙල් ලිපිය උක්ත කරුණ සඳහා මනා සාක්ෂ්‍යයකි (Paranavitana, 1970,p,xcviii,No.830). සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි ද මැණික්කරුවන් පිළිබඳව සටහන් කර තිබේ. ඉන් ගම්‍යවන්නේ ආරාමික කාර්යයන්වලදී ද මැණික්කරුවන්ට විශේෂ ස්ථානයක් හිමිව තිබූ බව පමණක් නොව ඔවුන් වෘත්තීය ශිල්පීන් ලෙස රාජ්‍යත්වයෙහි ද පිළිගැනීමට ලක්ව තිබූ බවකි. (Wickremasinghe,1912,p,.97). මෙසේ සලකා බලන කල මැණික් කර්මාන්තයෙහි නියුතු ශිල්පීන් විශේෂ ශිල්පීය කණ්ඩායමක් ලෙස සමාජ ප්‍රභූත්වය ද සහිතව සිටි පිරිසක් බැව් පෙනේ.

**ඇත් දත් ශිල්පීන්**

මෙම ශිල්පීන් පිළිබඳව ශිලා ලේඛනයන්හි බහුලව තොරතුරු හමු නොවේ. එහෙත් වේගිරි දේවාල සෙල්ලිපියක 'දතිකශුමන'(Paranavitana, 1970,no,807) නම් පුද්ගලයකු පිළිබඳව සඳහන්වන අතර පරණවිතාන මහතා එය පරිවර්තනය කර ඇත්තේ ඇත්දත්වලින් නිර්මාණ කරන්නා (Worker in Ivory)යනුවෙනි. ඇත් දත්වලින් නිර්මාණ කිරීමේ කර්මාන්ත අනුරාධපුර රාජ්‍ය සමයෙහි ප්‍රධාන කර්මාන්තයක් ලෙස පැවතුණි. (Paranavitana, 1970,no,807). උක්ත ශිලාලේඛනයෙහි සඳහන් කරුණ සහේතුක බව විසුද්ධිමාර්ගයේ එන කතාවකින් ද පැහැදිලි වේ. 'එක් කඩක් තරව හැද හරද එක් කඩක හිසෙහි බැඳ ඇත්දත් සුණු ඇඟපුරා තවරාගෙන නොයෙක් ඇත් දත් කැටයම්

කරන්නාවූ ශිල්පියෙකු දැක' (ධර්මවංස,1959,පිට,485) සීලව නාගරාජ ජාතකයෙහි ඇත්දත් කැටයම් කරන්නවුන්ගේ වීථියක් ඇති බව දක්වා තිබේ.[19] මේ අය තම නිර්මාණ කරමින් ඒවා වෙළඳාමේ නියුක්තව ධනවත් ව වාසය කළ ශිල්පියෙකු පිළිබඳ පුවතක් සහස්සවත්ථුවේ එයි. එම කර්මාන්තයෙහි නියුතු ශිල්පීන් විසූ ගම දත්තකාර ග්‍රාමය ලෙස නම් කර තිබේ. දත්තකාර ග්‍රාමයේ දත්තකාර කෙළඹියා නමින් ඉතා ම ප්‍රසිද්ධවූත් ධනවත් වූත් වෙළෙන්දෙකු අනුරපුර රාජධානි සමයෙහි විසූ බව මෙමගින් පැහැදිලි වේ. (බුද්ධදත්ත,1959,පිටු, 191.-192). මෙම වෘත්තින් උගන්වන ශාස්ත්‍ර ශාලා තිබූ අතර එහි දී වෘත්තිකයන් පුහුණු කිරීම සිදු කරන්නට ඇති බවට ද සාක්ෂ්‍ය හමු වේ. ජෙට්ඨතිස්ස රජු ඇත්දත් කැටයම් ශිල්පයෙහි නිපුනයෙකු බවත් ඔහු විසින් අරඹන ලද ශිල්පායතනයක් තුළින් බොහෝ ජනයාට මේ ශිල්පය ඉගැන්වූ බවත් මහාවංශයෙහි දැක්වෙන පුවත ඒ සඳහා මනා නිදසුනකි (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.37,ගාථා,101.103). මේ අයුරින් දත්තකාර ශිල්පීන් මෙම සමාජයෙහි සුවිශේෂී නිර්මාණකරුවන් පිරිසක් බව පෙන්වා දිය හැකි ය. එසේ ම මොවුන්ගේ ශිල්පීය දක්ෂතාවකින් අනුව ධනවත් හෝ දුප්පත් බව තීරණය වී තිබූ බව ද ඉහත තොරතුරුවලින් ම පැහැදිලි වේ. එපමණක් ද නොව රජු පවා මෙම ශිල්පයෙහි දක්ෂයෙකු වීමෙන් පැහැදිලි වන්නේ මෙම වෘත්තිය ද සමාජ බෙදීම් වන කුල ගෝත්‍රවලින් බැහැරව නිර්මාණ ශීලීත්වය සහ හැකියාව මත පදනම් වූ කර්මාන්තයක් බවයි.

**චිත්‍රකාර ශිල්පීන්**

ශ්‍රී මහා බෝධිය පැමිණීමට ප්‍රථම ශ්‍රී ලංකාවේ සිත්තරුන් සිටි බව බෝධි ආගමන අවස්ථවේ දී කරන ලදැයි විස්තර වන සැරසිලි අනුව පැහැදිලි වේ (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912, පරි.19,ගාථා,35.45). මෙම ශිල්පීන්ගේ නායකත්වය ශ්‍රී මහා බෝධිය සමග පැමිණි නායකතැනට පිරිනමන ලදි. ඒ බව සිංහල බෝධිවංශයේ දැක්වෙන්නේ සිත්තර කුලෙහි ප්‍රධානයාහට තමා පිරිවර සිත්තරුන් ගෙන මහබෝ මුදුනෙහි බඳනා විසිතුරු වියන් කරවා දෙනු කොට මුදුන්තරුවනා තනතුර ලබා දී තිබේ (සිරිපාල,2018,පිට,250). පාලි බෝධිවංශයෙහි ද මෙම කරුණ සවිස්තරව දක්වා තිබේ. (පඳින්නෝරුවේ,1901,පිට,102). ථූපවංසයට අනුව දුටුගැමුණු රජුවිසින් ආරම්භ කරන ලද රුවන්වැලි මහා ස්තූප ගර්භයෙහි නොයෙක් විසිතුරු මාලාකර්ම ලතා කර්මයන්ගේ පටන් විවිධ නිර්මාණ සිදු කර තිබේ. අනුරාධපුර නගරයෙහි වූ ථූපාරාමයට නැගෙනහිරින් පිහිටා තිබූ සිතුවම් සහිත ශාලාවක් පිළිබඳව මහාවංසයෙහි දැක්වේ (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912, පරි.20,ගාථා,53). මොවූහු ප්‍රධාන වශයෙන් ආරාම විසිතුරුකරණයෙහි රාජකාරිමය වශයෙන් යොදවා තිබුණි (Wickremasinghe,1912,p,.01¡09). රාජ්‍යත්වය සමග නිරන්තරව මොවුහු කටයුතු කළ අයුරු ධාතුවංසයෙහි දැක්වෙන සේරුවිල මංගල මහාස්තූපය නිර්මාණයේ දී ඔවුන් විසින් ලබා දුන් දායකත්වය අනුව පැහැදිලි වේ(විජේරත්න,2019,පිටු,553.569). එසේ ම දුටුගැමුණු රජුගේ මහාථූපය අවසන් කිරීමේ කාර්යය දක්වා ම මොවුහු දායක වූහ(හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912, පරි.30,ගාථා,62.98). මොවුන් ද පෙර සාකච්ඡා කරන ලද ශිල්පීන් සේ ම සමාජයේ ප්‍රභූ තත්ත්වයක සිටි බව අපට බිල්ලෑවෙන් ලැබෙන සෙල් ලිපියකින් පැහැදිලි වේ (Paranavitana, 1970,no,1119).[20] ප්‍රධාන ආරාමයන්හි සිටි කර්මාන්ත ශිල්පීන් අතර ප්‍රධාන ස්ථානයක් ගත් ශිල්පී කණ්ඩායමක් ලෙස සිත්තරුන් විශාල කාර්යභාරයක් ඉටුකර තිබේ.(Wickremasinghe,1912,p,.01.09). මේ බව සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා ලිපියෙහි සිර්වඩු යන්නෙන් සිත්තරුන් හඳුන්වා ඔවුන් විෂයෙහි

ආයතනය පැවතිය යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබීම තුළින් විශ්වාස කළ හැකි ය (Wickremasinghe,1912,p,.75.113). අභයගිරි සංස්කෘත ලිපියෙහි දැක්වෙන කුසලතා පූර්ණ ශිල්පීන් ගණයට මොවුන් ද ඇතුළත් ව තිබේ (Wickremasinghe,1912,p,.01.09). මොවුන් පින්තාරුකරුවන් ලෙස අපට වෙන ම වර්ග කිරීමට හැකි අවස්ථාවන් රැසක් ශිලාලේඛනවලින් පැහැදිලි කර ගැනීමට හැකියාව පවතී.

වංශකථාවේ සිත්තරුන් පිළිබඳව නිබඳව අසන්නට ලැබෙන අතර මොවුන්ගේ ගම් නිශ්චිතව කුමන ප්‍රදේශයක පිහිටියේදැයි සිතා ගැනීමට තරම් සාධක නොමැත. පොලොන්නරු යුගය තුළ සිදු වූ දේශපාලන අස්ථාවර භාවය හමුවේ. ශිල්පීය ශ්‍රේණිය අභාවයට ගිය ද ඔවුන්ගේ ශිල්පීය ගුරුකුලයන් පූර්ණ වශයෙන් විනාශ වී නොගිය බව මහාවංශයෙන් හෙළි වේ (හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, 1912ල පරි.86,ගාථාව,105).

ධනුර්දර

ශ්‍රී මහා බෝධි අංකුරය වඩමවා ගෙන එන ගමනේ දී පැමිණි ධනුර්ධර පවුල් අටෙහි ප්‍රධානියාට ධනුග්ගාහක නා තනතුර ප්‍රදානය කර තිබේ. ඔහුට භාර රාජකාරිය වූයේ ස්වකීය පිරිස සමග දුනු හී රැගෙන බෝධියේ ලගින්නට එන කපුටන් ආදි කුරුල්ලන් පලවා හැරීම ය(පදින්නෝරුවේ,1901,පිට,102).[21] සිංහල බෝධිවංසයට අනුව මෙම ශිල්පීය ශ්‍රේණියෙහි සාමාජිකයින් මහාබෝධි ආරක්ඛට්ඨාන හෙවත් මහබෝ රකිනා පිණිස කැප කර තිබේ(සිරිපාල,2018,පිට,214).[22] මහ බෝ රැකීම පමණක් නොව ප්‍රායෝග ික සමාජ ජීවිතයේ දී ද ධනුර්ධරයන් ආරක්ෂක අංශයට සම්බන්ධ ශිල්පීය කණ්ඩායමක් ලෙස ප්‍රතිෂ්ඨාපනය වී සිටි බවට තොරතුරු ලැබේ.

පරම්පරාවෙන් පමණක් නොව ශිල්පියාගේ දක්ෂතාව මත ද මෙම ශිල්පය ප්‍රගුණ කරන ලදි. ඉතා ම ප්‍රභූ පන්තියක් නියෝජනය කළ අයත් ධනුද්ධරයන් වූ අතර ඔවුන් විසින් පුදන ලද පූජාවන් තුළින් මෙන් ම ඔවුන් පිළිබඳව එන තොරතුරු වලින් ඒ බව පැහැදිලිව පෙනේ. ධනුර්ධරයෙකු වීම සඳහා බලපෑවේ ඒ සඳහා යෙදෙන්නන්ගේ දක්ෂතාව මිස වෙන කිසිවක් නොවන බැව් හඳගල ලිපිය තුළින් පෙනේ. එහි දී පරුමකවරයෙකු වූ බ්‍රාහ්මණගේ පුත් ගුප්ත නම් කෙනෙක් පිළිබඳව සඳහන් වෙයි (Paranavitana, 1970,no,1136).[23] වර්තමාන මුල්ලිකුම් මලේ ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද ධනුගය ගුප්තගේ පූජාවන් පිළිබඳව සොයා බැලීමේ දී ඔහු විසින් චෛත්‍යයක් (එල්ලාවල,1999,පිට,44)[24] ද, විහාරයක්ද,(එම)[25] ලෙණක් ද(එම)[26] යනාදි ලෙස අංග සම්පූර්ණ ආරාමයක් කරවා පූජා කර ඇති බව පෙනෙයි. දුනුවාකම් කිරීම සඳහා එසේත් නොමැති නම් වෘත්තීය ධනුර්ධයෙකු බවට පත් වීම සඳහා ඒ අධ්‍යාපනය ලබාගත යුතු විය. මුකලු නම් ගමෙහි සිටි ධනු ආචාර්යවරු පිළිබඳව දැක්වෙන නුවරකන් ද සෙල්ලිපිය((Paranavitana, 1970,no,925))[27] වෘත්තීයමය ශිල්පාචාර්යවරුන් පිළිබඳ සඳහනකි. සාමාන්‍ය වශයෙන් දුනුවාකමෙහි නියුතු වූවන් පිළිබඳව ශිලා ලිපි රැසක් හමුව තිබේ. ඒ අතර චලු (ibid no,490)[28] හා ශුමන (ibid no,846)[29] යන ධනුර්ධරයන් ප්‍රධාන තැනක් ගනී. දුනු නිෂ්පාදකයන් ද මේ වෘත්තිකයින් අතර සිටි බව පෙනේ (ibid no,1136).[30] මහාවංශයෙහි දක්වා ඇති ආකාරයට ධනු ශිල්පය වංශ පරපුරින් පැවත ආ දෙයක් බව උත්පල නැමැත්තාගේ පුත්‍ර වූ ඵුස්සදේවට ඔහුගේ පරපුරින් පැවත ආ ධනුශිල්පය ඉගැන්වීම පිළිබඳව දක්වා ඇති තොරතුරු මගින් පැහැදිලි වේ. එසේ ම ඔහු එම ශිල්පයෙහි කෙළපැමිණි බව වංසකථාව තවදුරටත් ප්‍රකාශ කරයි(හික්කඩුවේ

සහ බටුවන්තුඩාවේ, 1912, පරි.23,ගාථාව,85).[31] ථූපවංසයෙහි දැක්වෙන්නේ "ඉක්බිති ඵුස්සදේවයාගේ පියාණෝ ඔහුට දුනු ශිල්පය ඉගැන්වූහ. ඒ කුමාර ශබ්ධවේධීය, වැලි පිරූ ගැල් ද විදපියා හීය පළවන්නේය, සමින් බඳනා ලද සම් ගැල් ද අටඟුල් සොළසාඟුල් බොල පියා පෝරු ද, දිඹුල් පෝරු ද, විද හීය පළවන්නේය සතරගුල් බොල යපට ද විද මැතින් ඈත පළවන්නේය, ඔහු විසින් හරන ලද ශරය ගොඩින් අට ඉස්බක් යන්නේය, දියෙන් ඉස්බක් යන්නේය (ගලගම,1955,පිට,160)[32]," යනුවෙනි. එපමණක් ද නොව රසවාහිනියට අනුව රජ කුමාරයා ද දුනු ශිල්පයෙහි පරතෙරට ගොස් ඇත.[33] සිතුල්පව්ව කොරවක්ගල සහ නැට්ටුක්කන්ද ලිපිවල ධනුර්ධර ශිල්පීන්ගේ පරම්පරා ලාංජනයැයි විශ්වාස කළ හැකි සටහන් දක්නට ලැබේ.

පොලොන්නරු යුගය වනවිට ඔවූහු දිවයිනේ නානා දිග්භාගයන්හි ව්‍යාප්ත වී ගිය අයුරු බෝධිවංශ ග්‍රන්ථ පද විවරණයේ විශේෂ සඳහනක් වූ 'පැසුළු ඔහු කොඩහර රටින් කොටසරෙහි කොප්පරුන් විසින් එවුන් හා එක්වූ...' යන තොරතුරින් අපට පැහැදිලි වන්නේ ධනුශිල්පය ව්‍යාප්තව ගිය ආකාරයයි. කොඩහර යනු ලක්දිව නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි ජනපදයකි. කොට්ටියාරාම ද විය හැකි ය. එහි සඳහන් කොප්පරුන් ද ධනුර්ධරයන්ගේ ම උපශ්‍රේණියකි. දුනුවායන් සිටි බව දැක්වෙන ගම් ද[34] තිබූ බව පෙනේ.

කිසියම් අතීත සමාජයක පැවැති ධූරාවලිය ආනාවරණය කර ගැනීම අතිශයින් ම සංකීර්ණ කටයුත්තකි. එහි සැකැස්ම සහ පැවැත්ම මෙන් ම වෙනස් වීම් පිළිබඳව ද විමසිය යුත්තේ ඉතා පැහැදිලි දත්ත පදනම් කර ගනිමිනි. මෙම පර්යේෂණ ලිපිය සඳහා ක්‍රි. පූ. තෙවන සියවසෙහි සිට ක්‍රි. ව. පළමු සියවස දක්වා ලියැවුණු ශිලාලේඛන ප්‍රධාන මූලාශ්‍රය වී තිබේ. උක්ත ලේඛනවල දැක්වෙන ශිල්පීන් විදාරණය කිරීම සඳහා වංසකතා මෙන් ම අටුවාවන්හි දැක්වෙන මූලාශ්‍රය ද භාවිත කර ඇත. මෙම සියලු මූලාශ්‍රය පරීක්‍ෂා කිරීමේ දී පැහැදිලිව පෙනනෙන කරුණ වන්නේ ක්‍රි. පූ. තෙවන සියවසේහි පටන් ක්‍රි. ව. පළමු සියවස දක්වා හඳුනාගත හැකි සමාජයෙහි සමාජ ධූරාවලිය සැකසී ඇත්තේ භාරතීය සමාජයෙහි ධූරාවලීන් බෙදුණු උප්පත්ති සාධකය මත නොව පුද්ගල විශේෂඥතාව මත බවයි. එහෙත් අනුරාධපුර රාජ්‍ය සමය අවසන් වන දහවන සියවස පමණ වන විට භාරතීය සමාජ බෙදීම් සහ සංස්කෘතික විශ්වාස මෙරට ක්‍රමයෙන් ස්ථාපිත වනු දැකගත හැකි ය. ඒ අනුව ආරම්භක සමයෙහි පැවැති ඉතා ම ශක්තිමත් සහ පැහැදිලි සමාජ සැකැස්ම සමකාලීන භූදේශපාලනික සාධක මත අවසන්ව යනු පෙනේ.

**ආන්තික සටහන්**

01. බලන්න. මහාවංසයෙහි සහ ථූපවංසයෙහි දසමහායෝධයන් පිළිබඳව ඇති විස්තරය.

02. "නිසිදී රුක්ඛමූලම්හි - කතත්තී තාපසී විය"

03. තතවය පුගහ ලෙණෙ)

04. පෙහෙකරවචි

05. කුම්භකාර කුල ජෙට්ඨස්ස කුම්භකාර නායකට්ඨානං සිබෝව,

    කුඹල් කුලයන් ප්‍රධාන තෙනැත්තන්ට තමාපිරිවර කුඹලුන් ගෙන මහබොහට බත් පුදන විල්වලා කරවා දෙනු.

06. එම 66 - 67 පිටු

07. ''සෝ එක දිවසං කුඹලබල ගාමං ගන්ත්වා''

08. කුබල චිතහ ලෙනෙ

09. බත ශුමනශ තිශහ උපශික ශුමනය උපශික තිශලය උපශක...කුමරශ ගපති දුතකශ කුබකරිශොනශ දතිකෙ සුමනශ මණිකර දතෙ පතිතෙ මණිකර වුඩෙ සපතිකෙ)

10. තලදර නගය පුත දෙවහ ලෙන

11. අනුරද තෙරහව තුලදර පුත සුමන හ ච මනපදසනෙ

12. ඉට්ඨකා වඩ්ඪකී චුණ්ණ වඩ්ඪකී දාරුවඩ්ඪකී

13. වඩු මහ ඇදුරන් නම් බෝධි වෙහෙර සෙනය ඉසා ඇදුරු වඩු දෙ ජනක්හට් ඉසා සිර්වඩු අට් ජනක් අට් ඉසා අළු වඩු දෙ ජනක්කට් ඉසා මෙක්නට් වඩුද්දෙවාගෙම ඉසා කටුවඩු දෙ ජනහ ඉසු ......

14. අදිකය උතරහ දුවෙ කහපණෙ මණිකර පුශ

15. මණිකර තිශහ දුවෙ

16. මණිකර මුලගුතහ

17. මණිකර නග

18. ගපති මණිකර තිශහ....

19. ''ඒ නුවරවට ඇවිදිනේ දන්තකාර වීථියට පැමිණ දන්ත විකෘතිකරවන්නා දැක.....පින්වන්ති....එබස් ඇසු දළ වඩුවෝ කියන්නේ..''

20. උපශක චිතකර දහත පුත කඩහ

21. ධනුග්ගාහ කුලජෙට්ඨස්ස මහා බෝධි ආරක්ඛයානං

22. "දුනුවා කුලෙහි ප්‍රධාන තැනැත්තන්ට තමාපිරිවර දුනුවායන් ගෙන දුනු හීතල පද මහාබොයට කපුටුවන් ආදින් බැස්ස නො දෙපා කොට මහබෝ රකිනා තනතුරු දුන්නේය.

23. පරුමක බමණ පුත ධනුක ගුතහ ලෙන

24. දනුගය ගුතහ තුබේ

25. දනුගය ගුතහ විහරෙ

26. දනුගය ගුතහ ලෙණෙ

27. මුකලු ගමික ශුමන පුත ඉදබුතිය ලෙණ ධනු අචිරියහ

28. ධනුගය චලුශ ලෙණ

29. ධනුගය ශුමන

30. පරුමක බමණහ පුත දනුකය ගුතහ

31. ධනුසිප්පං අකාරෙසි තසස වංශාගතං පිතා

වංස, 361 (පියපරපුරෙන් හා ධනුශිල්පය පුතාට ඉගැන්වී ය.)

32. ථූපවංසය 160 පිට සිංහල ථූපවංසය, සංස්.ගලගම සරණංකර හිමි, කොළඹ, 1955,

33. අථස්ස පිතා උප්පල කුටුම්බිකො තං ද්වාස වස්සකාලේ අත්තනො වංසානුගතං ධනුසිකබං සික්ඛාපෙසි

34. NO 514,දූනුවාගමුල NO.503, දූනුවාගම

## ආශ්‍රිත ග්‍රන්ථ


ගෛගර්, විල්හෙම්., 1962. මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය, ඇම්. බී. ආරියපාල (පරි). කොළඹ.

දීපවංසය., 1970. කිරිඇල්ලේ ඤාණවිමල හිමි (සංස්). කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධම්පදට්ඨකතා, 1919. හේවාවිතාරණ (සංස්). කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය.

පාලි බෝධිවංසය., (1901). පදින්නෝරුවේ සෝභිත හිමි (සංස්). කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මහාවංශය, (1912). ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත (සංස්). කොළඹ:ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

මේධානන්ද, එල්ලාවල., (2008). නවතම  නවතම ශිලාලිපි ගවේශන,මරදාන:දයාවංස ජයකොඩි

රසවාහිනිය: දුතියෝ භාගෝ., 1920. සරණතිස්ස ථෙර (සංස්). කොළඹ.

විභංගට්ඨකතා., (2007).බී.එම්.පී. බාලසූරිය, (සංස්).දෙහිවල:බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සද්ධර්ම රත්නාවලිය., (2014). විජිතනන්ද සරත්චන්ද්‍ර(සංස්).දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සාරථ දීපනිය, 1914. බිහල්පොල දේවරක්ෂිත (සංස්). කොළඹ.

සීහලවත්ථුප්පකරණය., (1958). පොල්වත්තේ බුද්ධදත්ත හිමි(සංස්). මරදාන: අනුල මුද්‍රණාලය.

සිංහල විසුද්ධිමාර්ගය., (1959). මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර (සංස්). මාතර.

සිංහල විසුද්ධිමාර්ගය., (1959). මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර (සංස්). මාතර.

සිංහල ධාතුවංසය., (2019).එම්.ඩබ්ලිව්.විමල් විජේරත්න,(සංස්). කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

සිංහල බෝධිවංශය., (2018). නෝමන් සිරිපාල (සංස්). කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

සිංහල බෝධිවංසය., 1929. වැලිගම ශ්‍රී ධර්මරත්න හිමි (සංස්). කොළඹ.

සිරි ධර්මරක්ඛිත, වැලමිටියාවේ., (1994). ශ්‍රී මහබෝධීන් වහන්සේ, කොළඹ.

සුමංගල විලාසිනිය., 1925. හේවාවිතාරණ (සංස්). කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය.

සෝරත හිමි, වැලිවිටියේ., 1952. සුමංගල ශබ්ද කෝෂය, කොළඹ.

Chakrabarti, D.K. and Lahiri, N. (1996). Copper and its alloys in ancient India. New Delhi: Munshiram Manoharlal Publishers Pvt. Ltd.

Deraniyagala, S.U. and Śrī Lanka. Department Of Archaeological Survey (1992). The prehistory of Sri Lanka : an ecological perspective / 1. Colombo: Dep. Of Archaeological Survey, Government Of Sri Lanka.

Epigraphia Zeylanica, Vol II., 1928. Senarath Paranvitana (ed). London: Oxford University Press.

Inscriptions of Ceylon, Vol II Part I., 1983. Senarath Paranvitana (ed). Colombo: Department of Archaeology.

Vol I, Part II., 2001. Senarath Paranvitana (ed). Colombo: Department of Archaeology.

Vol I., 1970. Senarath Paranvitana (ed). Colombo: Department of Archaeology.

Jha, V. (1991). Social Stratification in Ancient India: Some Reflections. Social Scientist, 19(3/4), p.19.

Kiran Kumar Thaplyal (1996). Guilds in ancient India : a study of guild organization in Northern India and Western Deccan from circa 600 BC to circa 600 AD. New Delhi Etc.: New Age International.

Michael, M. E., 1960. Aspects of Caste in South India, Ceylon and North-west Pakistan. International Affairs, 37(02), p. 263–264.

Nandadeva Wijesekera (1987). The people of Ceylon. Colombo: Gunasena.

NICHOLAS, C.W. (1957). Professions and Occupations in the Early Sinhalese Kingdom. The Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain & Ireland, [online] 5(1), pp.68–80. Available at: https://www.jstor.org/stable/45377708 [Accessed 10 Feb. 2022].

PARANAVITANA, S. (1929). PRE-BUDDHIST RELIGIOUS BELIEFS IN CEYLON. The Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain & Ireland, [online] 31(82), pp.302–328. Available at: https://www.jstor.org/stable/43483299 [Accessed 10 Feb. 2022].

Ryan, Bryce., Caste in modern Ceylon The Sinhalese System in Transition, New Jersey: Rutgers university press.

Senarat Paranavitana (1956). Sigiri graffiti : being Sinhalese verses of the eighth, ninth and tenth centuries / Vol. 1, Introduction and plates. London: Oxford University Press.

Uduwara, J. ed., (1991). Epigraphia Zeylanica. Colombo: department of Archaeology.

Walpola Rahula (1966). History of Buddhism in Ceylon : the Anurādhapura period. Colombo: Gunasena.

Wickremasinghe, D.M. de Z. (1912). Epigraphia zeylanica: 1904-1912. London Oxford University Press.